ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
உள்நாட்டலுவல்கள் அமைச்சு
**MINISTRY OF HOME AFFAIRS**
ප්‍රාදේශීය පාලන අංශය
பிரதேச நிர்வாகப் பிரிவு
**DIVISIONAL ADMINISTRATION DIVISION**
නිදහස් චතුරශ්‍රය, කොළඹ .07 சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka.

දුරකථන / தொலைபேசி / Telephone : 011-2696211-13 | ෆැක්ස් / தொலைநகல் / Fax : 011-2699897 | ඊ-මේල් / மின்னஞ்சல் / E-mail : sas-divi@pubad.gov.lk | වෙබ් අඩවිය / இணையத் தளம் / Website : www.pubad.gov.lk

මගේ අංකය / எனது இல / My No : HAF-2/15/CORDI/15/1504
ඔබේ අංකය / உமது இல / Your No :
දිනය / திகதி / Date : 2017.07. 21

ප්‍රාදේශීය පාලන චක්‍රලේඛ - 2017 - 03

සියලුම දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>ආදර්ශ අත්සන් ලබා ගැනීම සඳහා.</u>**

උක්ත කරුණ සම්බන්ධව විදේශ කටයුතු අමාත්‍යාංශය - කොන්සියුලර් අංශයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක FA/CONS/D2/Specimen හා 2017.03.28 දිනැති ලිපිය හා බැදේ.

02. සියලුම දිස්ත්‍රිකයන්ට අයත් ප්‍රාදේශීය ලේකම්වරුන් හා ග්‍රාමීය රෙජිස්ට්‍රාර්වරුන් විසින් අත්සන් කරන උප්පැන්න/විවාහ/මරණ හා ග්‍රාම නිලධාරී සහතිකපත් සත්‍යාපනය කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය වෙත එවනු ලබයි. ඒ අනුව සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් හා ග්‍රාමීය රෙජිස්ට්‍රාර්වරුන්ගේ ආදර්ශ අත්සන් සහ නිල මුද්‍රා තොරතුරු යාවත්කාලීන කරමින් ඉමහත් සේවාවක් ඉටු කර ඇති බව ද විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය විසින් මා වෙත වාර්තා කර ඇත.

03. එනමුදු වාර්ෂික ස්ථාන මාරුවීම් හේතුවෙන් පැමිණ ඇති සහ නව පත්වීම් ලැබ පැමිණෙන නිලධාරීන්ගේ ආදර්ශ අත්සන් හා නිල මුද්‍රා තොරතුරු යාවත්කාලීන නොවී පැවතීම හේතුවෙන් මහජනතාව වෙත කාර්යක්ෂම සේවාවක් ලබාදීමට අපහසු වන අවස්ථා නිරීක්ෂණය වේ.

04. ඒ හේතුවෙන් ස්ථාන මාරුවීම් හා නව පත්වීම් ක්‍රියාවලිය සිදු කරන අවස්ථාවේදී නව දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් හා ග්‍රාමීය රෙජිස්ට්‍රාර්වරුන්ගේ ආදර්ශ අත්සන් සහ නිල මුද්‍රා තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා මේ සමඟ අමුණා ඇති තොරතුරු ඇතුළත් ආකෘති පත්‍රය පුරවා දින 14 ක් ඇතුළත විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත සාමාන්‍ය තැපැලෙන් හා විද්‍යුත් තැපැලෙන් යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

05.එමෙන්ම විදේශ රැකියා සඳහා හෝ විදේශ රටවලට ඉදිරිපත් කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකපත්‍ර නිකුත් කිරීම ඩීඑස් 04 (DS 04) ආකෘති පත්‍රය පමණක් භාවිත කර ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම් හෝ පරිපාලන නිලධාරීගේ අනු අත්සනින් පමණක් සිදුකරන ලෙස වැඩිදුරටත් දන්වමි.

නීල් ද අල්විස්
ලේකම්
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

පිටපත - අධ්‍යක්ෂ ජනරාල්, කොන්සියුලර් අංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.

## විදේශ කටයුතු අමාත්‍යාංශය

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ග්‍රාමීය ප්‍රාදේශීකය | නිළධාරියාගේ නම | නිළධාරියාගේ ආදර්ශ අත්සන | නිළධාරියාගේ නිල මුද්‍රාව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

**Note : Please e - mail this sheet to consular@mfa.gov.lk or fax to 011-2385571**